සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම - 2015
--------------------------------------------------------------------------

සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 19 දරන සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනතේ 11(2) වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර පදනමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මත සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.25,675,995 ක් වූ කෙරීගෙන යන වැඩ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දැක්වීම වෙනුවට ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතයේ 47 වන ඡේදයේ විධිවිධාන පරිදි දේපළ පිරියත හා උපකරණ සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර වත්කම් ගිණුමෙහි දැක්වෙන පිරිවැය රු. 625,453,272 ක් වූ වත්කම් සම්බන්ධයෙන් එම විධිවිධාන වලට අනුව කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 72 වගන්තිය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි වෙන වෙනම හඳුනා ගැනීමකින් තොරව 2005 වර්ෂයේ දී පදනමට පවරා දී තිබුණු වටිනාකම රු. 272,000,000 ක් වූ ඉඩම් හා ගොඩනැගිලිවලින් සියයට 50 ක් ගොඩනැගිලිවල වටිනාකම ලෙස සලකා ක්ෂය කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

අන්තර්ජාල සේවා සමාගමක් විසින් පදනමට අයත් ප්‍රජාශක්ති මධ්‍යස්ථානවල 2009 දෙසැම්බර් 16 දින සිට 2013 නොවැම්බර් 01 දින දක්වා කරන ලද V-SAT ඇන්ටනා නඩත්තු සේවා අවස්ථා 120 කින් 96 ක් සඳහා ගෙවියයුතු රු.7,008,000 ක් ගිණුම් ගතකර නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂවලට අදාලව රේඛීය අමාත්‍යාංශයෙන් රු.4,356,341 ක මුදලක් පදනම වෙත ප්‍රතිපූරණය කළ යුතු ලෙස දක්වා තිබුණද එවැනි මුදලක් පදනමට ප්‍රතිපූරණය කළ යුතු ලෙසට අදාල රේඛීය අමාත්‍යාංශයේ ගිණුම් වාර්තාවලින් හෙලිදරව් නොකෙරිණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

--------------------------------------

පදනමට ලැබිය යුතු එකතුව රු.9,124,815 ක මුදලක් හා පදනමෙන් ගෙවිය යුතු එකතුව රු.117,122,744 ක ගිණුම් ශේෂ සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ පැවැත්වූ දැයට කිරුළ උත්සවය වෙනුවෙන් ඉදිකරන ලද වෙළඳ කුටි සඳහා පෞද්ගලික ආයතනයකට ගෙවියයුතු රු.282,567 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි.

(ආ) දීර්ඝ කාලයක් තිස්සේ ඉදිරියට ගෙන එමින් පවතින රු.13,084,208 ක් වූ අත්තිකාරම් හා ණයගැති ශේෂයන්ද රු.6,074,979 ක් වූ ණයහිමි ශේෂයන්ද අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 නොවැම්බර් 07 දින පවත්වන ලද පොදු ව්‍යාපාර සඳහා වූ කාරක සභාවේදී ද ආපසු අයකර ගැනීම අවධාරණය කරන ලද ලංකා කම්කරු කොංග්‍රසයේ ගොඩනැගිල්ලකට පදනම විසින් කරන ලද ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගතයුතු රු.1,271,709 ක මුදල 2016 වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඈ) ප්‍රජාශක්ති සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා දත්ත ගොනුවක් පවත්වාගෙන යාමට පරිගණක පද්ධතියක් ඇති කිරීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් වෙත 2014 අප්‍රේල් 23 දින රු.541,840 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණද, එම කාර්යය ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් ලබාදුන් අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) අදාල රේඛීය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කර ගැනීමේ පදනම මත ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්වල දක්වා තිබුණු 2013 වර්ෂයේ හා ඊට පෙර වර්ෂවලදී ඉදිරියට ගෙන එන ලද රු.6,813,624 ක මුදලක් හා 2014 වර්ෂයේ ලැබිය යුතු රු.47,370,427 ක් 2016 වර්ෂය අවසානය දක්වාම ප්‍රතිපූරණය කර ගෙන නොතිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2005 අංක 19 දරන සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනතේ | |
| | (i) 3(1) වගන්තිය | 2015 අගෝස්තු මාසයෙන් පසු පදනම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර නොතිබුණි. |
| | (ii) 10 වගන්තියේ 2,3 හා 4 ඡේද | ස්වකීය බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී දරන සියලු වියදම් පදනම ගොඩ නගා ගත් අරමුදලින් දැරිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල පදනම උපයා තිබුණේ රු.මිලියන 3.4 ක ආදායමක් පමණි. ඒ අනුව පදනමේ සියලු වියදම්වලට අදාල මුදල් අදාල රේඛීය අමාත්‍යාංශයෙන් ලබාගෙන පදනමේ කාර්යයන් ක්‍රියාත්මක කර තිබුණි. |
| (ආ) | 1998 දෙසැම්බර් 31 දරන සේවක අර්ථසාධක අරමුදල් සංශෝධිත පනතේ II කොටසේ 10 (1) හා (2) ඡේද | 2012 සැප්තැම්බර් මාසයේ සිට 2013 මාර්තු මාසය දක්වා එකතුව රු.4,205,282 ක් වූ සේවකයින්ගේ හා සේව්‍යයාගේ අර්ථසාධක අරමුදල් දායකය සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 757 | පදනමේ සියලු අංශ ආවරණය වන පරිදි සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (ඈ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ඡේදය | පරිගණක මිලදී ගැනීම හා V-SAT ඇන්ටනා නඩත්තු සේවාව ලබා ගැනීම සඳහා 2009 සැප්තැම්බර් සිට 2014 මාර්තු මාසය දක්වා ගිවිසුමකින් තොරව රු.51,099,464 ක මුදලක් පෞද්ගලික සේවා ආයතනයකට ගෙවා තිබුණි. |
| (ඉ) | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අදාල කාර්යය නිමකළ විගස ලබා ගත් අත්තිකාරම් නිරවුල් කළ යුතු වුවද, ප්‍රජා ශක්ති ව්‍යාපෘතියේ කළමනාකරුට 2011 හා 2013 වර්ෂවල දී ලබා දී තිබුණු පිළිවෙලින් එකතුව රු.318,867 ක් හා එකතුව රු.118,071 ක් වූ අත්තිකාරම් 2016 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ පදනමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 45,027,660 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.48,715,500 ක් වීමෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,687,840 ක වර්ධනයක් නිරීක්ෂණය විය. රජයේ ප්‍රදාන රු.71,200,209 කින් අඩු වුවද පරිත්‍යාග, ප්‍රචාරන හා ප්‍රවර්ධන වියදම් රු.58,053,559 කින් ද පරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීම්, ගමන් වියදම් හා ඉන්ධන වියදම් වැනි විවිධ වියදම් රු. 9,972,149 කින් ද, රැස්වීම්, පුහුණු කිරීම් හා වෙනත් වියදම් රු.16,621,645 කින් ද, අඩුවීම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ පහක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2010 වර්ෂයේ රු.11,511,530 ක් වූ ඌනතාවය 2015 වර්ෂය වන විට රු.45,027,660 ක් වී තිබුණි. කෙසේවුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී පදනමේ 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වර්ෂ පහක ධන දායකත්වය පිළිවෙලින් රු.37,117,620 ක්, රු.37,819,654 ක්, රු.57,143,901 ක්, රු.69,018,051 ක් හා රු.85,973,434 ක් වී තිබුණි. 2013, 2014 හා 2015 යන වර්ෂවල දායකත්වය වැඩිවීමට වැටුප් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා පිළිවෙලින් රු.මිලියන 47 ක් හා රු. මිලියන 153 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල ප්‍රාග්ධන වියදම් වශයෙන් කිසිදු මුදලක් වැයකර නොතිබුණි. කාර්ය මණ්ඩලයට වැටුප් හා වේතන සහ අදාල වෙනත් පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 74.8 ක් අදාල රේඛිය අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි පුනරාවර්තන වියදම් පියවීම වෙනුවෙන් රු. මිලියන 20.96 ක් අදාල රේඛිය අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව තිබුණි. තවද, පදනම විසින් සේවක මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂයේ මුල් මාස තුනෙහි වැටුප් හා අගෝස්තු සිට නොවැම්බර් දක්වා වූ වැටුප් ගෙවා තිබුණේ 2015 දෙසැම්බර් මාසය අවසානයේ දී විය.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පදනමේ කාර්යයන් සඳහා කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණු අතර වර්ෂයේ මුල් මාස තුනෙන් පසු පදනම විසින් සැලසුම් කළ කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පදනම විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 42 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර තවත් ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 35 ක් ඉදිකිරීමට 2012 වර්ෂයේ දී ඉඩම් මැනුම් කටයුතු සිදුකිරීම සඳහා රු. 2,359,298 ක් වැය කර තිබුණද, 2016 වර්ෂය අවසානය දක්වාම එම ඉඩම් පදනම වෙත පවරා ගෙන නොතිබුණි.

(ආ) 2005 අංක 19 දරන පදනම පිහිට වූ පනතේ 10(2) වගන්තිය යටතේ පදනමට පවරාදී තිබුණු රු. මිලියන 272 ක් වූ ඉඩම් හා ගොඩනැගිලිවලට අදාල ලිපිලේඛන නොමැතිවීම හේතුවෙන් 2016 දෙසැම්බර් අවසානය වන විටත් හිමිකම් ඔප්පු පිළියෙල කර නොතිබුණි.

(ඇ) ප්‍රජාශක්ති ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ප්‍රදේශ කිහිපයක ක්ෂේත්‍ර සම්බන්ධීකරණ කටයුතු සඳහා අමාත්‍යාංශය විසින් පදනම වෙත ලබාදී තිබුණු රු.20,484,000 ක් පත්වීම් ලිපියක් හෝ නිශ්චිත කාර්ය පැවරුමක් නොමැතිව හා සත්‍ය වශයෙන් ඉටුකළ රාජකාරි කටයුතු පිළිබඳ තහවුරු කිරීමකින් තොරව නිලධාරීන් 90 දෙනෙකු වෙත 2010 වර්ෂයේ සිට 2013 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය සඳහා වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඇ) ඉහත සඳහන් පරිදි ක්ෂේත්‍ර සම්බන්ධීකරණ කටයුතු සම්බන්ධයෙන් පැවති දුර්වල කළමනාකරණය හේතුවෙන් පදනමේ ව්‍යාපෘති කළමණාකරු හා ව්‍යාපෘති සම්බන්ධීකාරක විසින් 2011 අප්‍රේල් සිට 2013 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය සඳහා ව්‍යාජ නම් ඉදිරිපත් කර ඔවුන්ගේ පෞද්ගලික බැංකු ගිණුම්වලට සම්බන්ධීකාරක දීමනා වලින් රු.4,252,500 ක් වංචා සහගතව බැරකරගෙන තිබුණි. ඒ පිළිබඳ සිදුකරන ලද විමර්ෂණයකින් පසුව එම නිලධාරීන් මුදල් ආපසු ගෙවීමට එකඟ වී තිබුණද 2014 මැයි 25 වන දින වනවිට රු.1,050,000 ක් ගෙවා තිබුණු අතර ඉතිරි රු. 3,202,500 ක් වූ මුදල් 2016 වර්ෂය අවසානය දක්වාම අයකරගෙන නොතිබුණි.

මෙම මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධයෙන් වූ නඩු විභාගය තවදුරටත් අවසන්වී නොමැති අතර රු. 3,202,500 ක් වූ මුදල අයකර ගැනීම උසාවි තීරණය මත සිදුවන බව මේ සම්බන්ධයෙන් ප්‍රජාශක්ති මෙහෙයුම් ඒකකයේ අධ්‍යක්ෂ (මුදල්) විසින් සඳහන් කර තිබුණි.

(ඉ) ක්ෂේත්‍ර සම්බන්ධිකාරක කටයුතු පදනම විසින් භාරගත් 2010 වර්ෂයේ සිට 2011 මාර්තු දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ක්ෂේත්‍ර සම්බන්ධිකාරක දීමනා රු.5,265,000 ක් පෞද්ගලික බැංකු ගිණුම්වලට බැර කර තිබීමට අදාලව පදනම විසින් විමර්ෂණයක් පවත්වා නොතිබුණි.

## 4.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිමෙන්ති බ්ලොක්ගල් මැෂින්, ක්‍රීඩා හා පූජා භාණ්ඩ, පරිගණක හා විවිධ උපකරණ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකර මිලදී ගත් දින සිට මාසයක් ඇතුලත මුදල් පියවීමේ පදනම මත 2014 වර්ෂය තුළ දී රු. 72,726,994 කට සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාවෙන් මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත් මෙම භාණ්ඩ සඳහා 2016 වර්ෂය අවසාන වන විටත් පදනම විසින් මුදල් ගෙවා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොනිමි වැඩ යටතේ වටිනාකම රු.25,675,995 ක් ලෙස දක්වා තිබුණු ඉදිකිරීම් 9 ක කොන්ත්‍රාත් වටිනාකමෙහි එකතුව රු.72,818,294 ක්වූ අතර එම ඉදිකිරීම් කටයුතු 2010, 2011 හා 2012 වර්ෂවල දී ආරම්භ කර අතර මග නවතා දමා තිබුණි. 2016 වර්ෂය අවසානය දක්වාම එම ඉදිකිරීම් නැවත ආරම්භ කිරීමට පදනම අපොහොසත්වී තිබුණි. අදාල ඉදිකිරීම් සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් කොන්ත්‍රාත්කරුවකුට රු.7,544,265 ක්ද ගෙවා තිබුණු අතර ඔහුට ගෙවියයුතු රු. 1,985,942 ක් 2012 වර්ෂයේ සිට ගිණුම්වලින් ඉදිරියට ගෙන ගොස් තිබුණි.

වර්ෂ 2015, 2016 හා 2017 වසර වල ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් වෙන්කර නොතිබුණු බැවින් එහි වැඩ ආරම්භ කිරීමට නොහැකිව පැවතුණු බවත් 2018 වර්ෂයේදී ඉතිරි වැඩ සම්පූර්ණ කිරීමට සැලසුම් සකස් කරමින් පවතින බවත් මේ සම්බන්ධයෙන් ප්‍රජාශක්ති අධ්‍යක්ෂ(මුදල්)විසින් සඳහන් කර තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය වත්කම්

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට භාවිතයෙන් ඉවත් කරන ලද සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණ පිරිවැය රු. 5,396,901 ක් වූ යතුරුපැදි 57 ක් විකිණීමට හෝ ඉවත් කිරීමට කටයුතු නොකර විගණිත දිනය වූ 2016 නොවැම්බර් 30 දින දක්වා නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ස්වයං රැකියා ණය ව්‍යාපෘතිය යටතේ (Self Employment Loan Project) ප්‍රජාශක්ති මධ්‍යස්ථානවලට ලබා දීම සඳහා 2014 දෙසැම්බර් 01 දින රු. 4,048,000 කට මිලදී ගෙන තිබුණු සිමෙන්ති බ්ලොක් ගල් මැෂින් 44 ක් 2015 පෙබරවාරි 24 දින අධිකරණ නියෝගයක් හේතුවෙන් අදාල ප්‍රජාශක්ති මධ්‍යස්ථානවලට ලබා දී නොතිබුණි. විගණිත දිනයවූ 2016 නොවැම්බර් 30 දින වන විටත් මෙම සිමෙන්ති බ්ලොක් ගල් මැෂින් 44 නෝවුඩ් තොණ්ඩමන් ක්‍රීඩා සංකීර්ණයේ ගබඩා කර නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) පරිත්‍යාග වශයෙන් බෙදාදීම සඳහා ණය පදනම යටතේ 2014 වර්ෂයේ මිලදී ගෙන තිබුණු වටිනාකම රු.2,794,368 ක්වූ කෝවිල් සීනු 15 ක් හා පිත්තල පූජා පහන් කට්ටල 377 ක් ද, කායවර්ධන උපකරණ කට්ටල 07 ක්ද, ක්‍රීඩා උපකරණ කට්ටල 194 ක් ද තොණ්ඩමන් ක්‍රීඩා සංකීර්ණයේ ගබඩා කර නිෂ්කාර්යව පැවතුණු බවට නිරීක්ෂණය විය.

(ඈ) 2007, 2008 හා 2009 වර්ෂවල දී ප්‍රජාශක්ති ව්‍යාපෘතිය යටතේ ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 42 කට අන්තර්ජාල සේවා සැපයීම, ඒ සඳහා උපදේශන ගාස්තු ගෙවීම, V-SAT ඇන්ටනා උපකරණ කට්ටල 42 ක් මිලදී ගැනීම හා එම උපකරණ නඩත්තු හා අලුත්වැඩියා කිරීම සඳහා රු.131,404,288 ක් වැයකර තිබුණද 2014 මාර්තු 01 දින සිට එම සේවාව ලබා ගැනීම නවතා දැමීම හේතුවෙන් එම උපකරණ කට්ටල 42 ක් විගණිත දිනය වූ 2016 වර්ෂය අවසානය දක්වා නිෂ්කාර්යව පැවතුණි. තවද මෙම සේවාව නවතා දැමීම සඳහා වූ අධ්‍යක්ෂක මණ්ඩල තීරණය විගණනයට ඉදිරිපත් නොවීය.

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ දක්වා ඇති පිරිවැය රු. 398,999 ක් වූ සමරු පළඟනා තොගයක් දීර්ඝ කාලයක සිට අදාල පාර්ශවයන් වෙත නිකුත් නොකර නිශ්කාර්යව පැවතුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

-------------------------

2010 දෙසැම්බර් 07 දිනැති අයවැය චක්‍රලේඛ 150 ට පටහැනිව සහ අදාල රේඛීය අමාත්‍යාංශයේ හා මුදල් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානයේ ප්‍රයෝජනය සඳහා රු.1,000,000 ක මූලික ගෙවීමක් සහ මාසික වාරික 60 කින් ගෙවීමේ පදනම මත රු. 5,840,000 කට මිට්ෂුබිසි ඩබල් කැබ් රථයක් 2014 නොවැම්බර් 26 දින මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ පෞද්ගලික සමාගමකින් මිලදීගෙන තිබුණි. නියමිත පරිදි කල්බදු වාරික නොගෙවීම හේතුවෙන් අදාල කැබ් රථය සමාලෝචිත වර්ෂය අවසානයට කල්බදුකරු විසින් වාහනය හා එහි අයිතිය ආපසු පවරාගෙන තිබුණි. වාහනය සඳහා මූලික ගෙවීම හා වාරික ලෙස එකතුව රු.1,565,504 ක මුදල ආයතනයට ආපසු අයකර ගත නොහැකි පාඩුවක් බව නිරීක්ෂණය විය.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව ප්‍රධාන කාර්යාලයේ හා අනුමත ව්‍යාපෘති 03 ක 2015 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 218 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 130 ක් වූයෙන් පුරප්පාඩු 88 ක් විය.

(ආ) තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සඳහා කාර්ය මණ්ඩලය හා වැටුප් ප්‍රමාණ අනුමත කරගෙන නොතිබුණද 2015 දෙසැම්බර් 31 දින සත්‍ය කාර්ය මණ්ඩලය 30 දෙනෙක් විය.

(ඇ) ප්‍රධාන කාර්යාලයේ ගණකාධිකාරී තනතුර ඇතුළුව තනතුරු 06 ක් දිගුකාලයක සිට පුරප්පාඩුව පැවතිණි. 2005 වර්ෂයේ සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මුදල්) තනතුර සඳහා ස්ථිර පුද්ගලයකු පත් නොකර වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරියකු කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි.

(ඈ) නෝවුඩ් ක්‍රීඩා සංකීර්ණ ව්‍යාපෘතිය සඳහා 2003 වර්ෂයේ දී තනතුරු 21 ක කාර්යමණ්ඩලයක් අනුමත කර තිබුණ ද එහි කටයුතු ක්‍රියාත්මක නොවන බැවින් එක් නිලධාරියෙකු පමණක් ක්‍රීඩා සංකීර්ණයේ යොදවා තිබුණි.

(ඉ) 2013 වර්ෂයේ දී පදනම විසින් රු.150,000 ක වියදමක් දරා බාහිර උපදේශකයෙකු වෙතින් සකස් කරවා ගත් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ පරිපාටිය 2016 වර්ෂය අවසානය වන විටත් අනුමත කරවාගෙන නොතිබුණි.

(ඊ) තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර තිබූ සංස්කෘතික නිලධාරී තනතුර සඳහා 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිලධාරියකු පත් කර නොතිබුණු අතර අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරු 4 ක ට නිලධාරීන් බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුල ඔවුන්ට රු. 1,190,732 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය ඉකුත් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් පදනම විසින් 2014 හා 2015 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 සැප්තැම්බර් 14 දින ඉදිරිපත් කර තිබුණි.

(ආ) 2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 වගන්තිය ප්‍රකාරව ගිණුම් ඉදිරිපත් කිරීමේ කළමනාකරුගේ වගකීම පිළිබඳ සහතිකය මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

2009 ජුනි 09 හා 2011 දෙසැම්බර් 23 දිනැති පිළිවෙලින් අංක DMA/2009(1) හා DMA/ADM/2011/1/26 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ කෙරෙහි අවධානය යොමුකර කාර්යක්ෂම අභ්‍යන්තර පාලන ව්‍යුහයක් ඇතිකර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය ප්‍රයෝජනයට ගත යුතු වුවත් අභ්‍යන්තර විගණක විසින් පුරප්පාඩුව තිබූ ගණකාධිකාරි තනතුරේ කාර්යයන් සිදු කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පදනම විසින් පිළියෙල කරන ලද අයවැය ලේඛනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

## 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පදනම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් පදනම ආරම්භ කළ 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම එසේ කර නොතිබුණි.

# 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර පදනමේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) කොන්ත්‍රාත් පරිපාලනය | නියමිත පරිදි කොන්ත්‍රාත් නිම නොකිරීම. |
| (ආ) සේවක මණ්ඩල පරිපාලනය | කාර්ය මණ්ඩලය පත් නොකිරීම හා බඳවාගැනීමේ කාර්යපරිපාටිය අනුමත කර නොගැනීම. |
| (ඇ) මූල්‍ය පාලනය | ගෙවීම් වවුචරයෙහි මතුපිට දක්වා ඇති ශුද්ධ මුදල විධිමත් පරිදි ගෙවන බව හා එම ගෙවීම් කළ බවට "ගෙවන ලදී" යන මුද්‍රාව ගෙවීම් වවුචරය මත හා ඒවා තහවුරු කරන අනෙකුත් ලියවිලි මත යොදා නොතිබීම. |
| (ඈ) වත්කම් කළමනාකරණය | වත්කම් නිෂ්කාර්යව පැවතීම. |
| (ඉ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනයක් සිදු නොකිරීම. |